# කොළඹ විශ්වවිද්‍යාලය

## අධ්‍යාපන පීඨය

### පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අර්ධ කාලීන) සිංහල මාධ්‍ය පාඨමාලාව
### පාසල් පුහුණුව අධීක්ෂණය සඳහා ප්‍රමුඛාචාර්ය තනතුරුවලට බඳවා ගැනීම

උක්ත කාර්යය සඳහා ප්‍රමුඛාචාර්යවරුන් වශයෙන් බැඳීමට කැමති දැනට පාසල්වල ගුරු සේවයේ, ගුරු අධ්‍යාපනඥ සේවයේ හෝ ගුරු උපදේශක ලෙස සේවයේ නියුතුවූවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඔබ පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.**

- **පිළිගත් විශ්වවිද්‍යාලයක** අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය හෝ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පරීක්ෂණයට අදාළ ඉගැන්වීම් පුහුණු විෂය සඳහා අවම වශයෙන් අධි සම්මාන මට්ටමේ(B) සාමාර්ථයක් සහිතව එකී පරීක්ෂණය සමත්වීම. (කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන ඩිප්ලෝමා/ අධ්‍යාපනවේදී උපාධි සඳහා ප්‍රමුඛත්වයක් ලැබේ.)
- එකී උපාධියෙන්/ ඩිප්ලෝමාවෙන් පසු අවම වශයෙන් වසර තුනක ඉගැන්වීම් පළපුරුද්ද.

*(මින් පෙර ප්‍රමුඛාචාර්යවරයෙකු ලෙස සේවය කර තිබීම හා අධ්‍යාපනපති, අධ්‍යාපන දර්ශනපති හා අධ්‍යාපන දර්ශනශූරි උපාධිධාරියෙකුවීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.)*

මේ සමඟ ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර 2024 ඔක්තෝබර් 30 හෝ ඊට පෙර ***"සම්බන්ධීකාරක, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අර්ධකාලීන) සිංහල මාධ්‍ය පාඨමාලාව, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ 03"*** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සියලු ම අයදුම්පත්‍ර සමඟ අදාළ අධ්‍යාපනවේදී උපාධි/ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහතිකයේ විස්තරාත්මක සහතිකයේ ඡායා පිටපතක් සහ විදුහල්පති ලවා සහතික කළ ඔබගේ පෞද්ගලික කාලසටහන හෝ නිරත රාජකාරියේ ආයතන ප්‍රධානියා විසින් සහතික කළ ඔබගේ රාජකාරි කටයුතු පිළිබඳ විස්තරයක් අමුණා එවන්න. අනෙකුත් අවශ්‍ය සහතික හා පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය. ලියුම් කවරයේ වම් කෙළවරේ ඉහළ **"ප්‍රමුඛාචාර්ය තනතුරු සඳහා"** යන්න සඳහන් කරන්න.

2025 වර්ෂයේ පළමු කාර්තුවේ දී ඔබ ඉල්ලුම් කරන ප්‍රදේශවල ගුරු සිසුන් හය දෙනෙකුගේ පමණ, ඔවුන් උගන්වන පාසල්වලට ගොස් ගුරු පුහුණු අධීක්ෂණ කටයුතුවල නිරතවීම අපේක්ෂා කෙරෙන අතර ඒ සඳහා අනුමත දීමනාවක් ගෙවනු ලැබේ. ප්‍රමුඛාචාර්යවරුන් තෝරා ගැනීමේ දී අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ද අදාළ විෂය පිළිබඳව ඇති ප්‍රවීණතාව ද උක්ත කාර්යය සඳහා පවතින ප්‍රාදේශීය අවශ්‍යතා ද ගැන සැලකිළිමත් වේ. එසේ තෝරා ගන්නා අය වෙත පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ. 2025 ජනවාරි මාසයෙන් පසුව ගුරු පුහුණුව අධීක්ෂණ කටයුතු ආරම්භ කළ හැකි අයදුම්කරුවන් පමණක් මේ සඳහා ඉල්ලුම් කරන්න.

අධ්‍යාපන පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ 03.

2024.10.10